-----------------------------------------------------------------------------------------------------------------------

# අලව්ව ප්‍රාදේශීය සභාව

## කුරුණෑගල දිස්ත්‍රික්කය

------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). මූල්‍ය ප්‍රකාශන වලට මූලධන ආධාර ලෙස රු.72,267,999 ක් ගෙන තිබුණද, 2011 වර්ෂය වෙනුවෙන් ලැබූ රු.17,170,025 ක මූලධන ලැබීම් ද එතුල ඇතුලත්ව තිබීමෙන් වර්ෂයේ මූලධන ආධාර රු.17,170,025 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). මූල්‍ය ප්‍රකාශන වලට ගෙවිය යුතු රු.1,510,800 ක වැටුප් ප්‍රතිපූරණ ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ආධාර (වැටුප් ප්‍රතිපූර්ණ) හා සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැතියෝ (වැටුප් ප්‍රතිපූර්ණ) රු.1,510,800 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). ලැබිය යුතු උසාවි දඩ ලෙස රු.1,968,712 ක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණද, අදාල ලිපිගොනුව අනුව ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.1,177,750 ක් වීමෙන් වර්ෂයට අදාලව උසාවි දඩ ආදායම රු.790,962 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.19,866,805 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,299,052 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,173,159 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 3,459 | 2,772 | 687 |
| (ii) | බදුකුලී | 7,399 | 6,942 | 457 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 546 | 546 | - |
| (iv) | වෙනත් ආදායම් | 22,972 | 22,972 | 20,237 |

2.2.2 වරිපනම් බදු

වර්ෂයට අදාලව වරිපනම් බදු බිල් කිරීම රු.1,307,154 ක් වූ අතර වර්ෂය අවසානයට 51% ක් ලෙස රු.669,355 ක හිඟයක් විය. මෙකී හිඟ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති සංග්‍රහයේ 33-42 වගන්ති පරිදි හිඟ ලැයිස්තු පිළියෙල කර අවසන් නිවේදන නිකුත් කර තිබුනේ බදු ඒකක 75 කට අදාලව පැවති රු.156,393 ක හිඟයක් සම්බන්ධයෙන් පමණි. ඉන් ඒකක 38 කට අදාලව රු.131,279 ක් අයකර ගෙන තිබූ අතර ඉතිරි රු.538,076 ක හිඟයක සම්බන්ධව පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු…1,968,712 ක් හා ලැබිය යුතු මුද්දර ගාසතු ප්‍රමාණය රු…18,268,708 ක් විය.

2.2.4 විනෝද බදු

සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන සිනමා ශාලාවේ විනෝද බදු අයකිරීම් වලට අදාලව ප්‍රවේශ පත්‍ර මුද්‍රා තැබීමක් සිදු නොවන අතර අදාල සිනමා ශාලාව විසින් නඩත්තු කරන ලද වාර්තා පදනම්ව රු.369,588 ක විනෝද බදු ආදායමක් අයකර තිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු

සභාව විසින් 2012 වර්ෂයේදී බදුදී තිබූ පොදු වැසිකිළිය වෙනුවෙන් අදාල ගිවිසුම් ප්‍රකාරව ජලය හා විදුලිය බදුකරු විසින් දැරිය යුතු බව දක්වා තිබුණද සභාව විසින් ජල ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් වන විට රු.12,906 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 රීතියේ විධිවිධාන ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර සභාවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රමාණය තහවුරු කරගෙන නොතිබූ අතර ලේඛන වල ඇතුලත් රු.18,706,555 ක වටිනාකම ගිණුම් ගතකර තිබුණි.

(ආ). වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.18,706,555 ක් වුවද, රු.12,958,285 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි 29 ක් වෙනුවෙන් නීත්‍යානුකුල භාවය (ඔප්පු) සනාථ කරගෙන නොතිබුණි. එමෙන්ම ස්ථාවර වත්කම් යටතේ පැවති රු.2,000,000 ක් වටිනා ප්‍රජාශාලාව හා රු.1,200,000 ක් වටිනා සතිපොල ගොඩනැගිල්ල හි වටිනාකම් තහවුරු කර ගැනීමකින් තොරව ගිණුම් වලට ගෙන තිබුණි.

(ඇ) 2011 වර්ෂයටත් පෙර සිට අක්‍රියව පැවත එන රු.200,000 ක් වටිනා අංක: 37-5160 දරණ ෆෝඩ් ට්‍රැක්ටරය වෙන්දේසි කර ගිණුම් වලින් ඉවත් කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට හෝ කටයුතු කර නොතිබණි.

(ඈ). 2003 නොවැම්බර් 28 දිනැති අංක: 1317 දරණ ගැසට් නිවේදනය අනුව පළකර ඇති "නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම" මැයෙන් වූ අතුරු ව්‍යවස්ථාවේ 11(5) වගන්තිය අනුව ඉඩම් කට්ටිකර විකිණීමේදී පොදු පහසුකම් සඳහා වෙන්කරන ලද ඉඩම් කට්ටි වලට අදාල ඔප්පු ලබාගත යුතු වුවද, සභාව විසින් පවත්වාගෙන ගොස් තිබූ ඉඩම් ලේඛනය අනුව ඉඩම් කට්ටි කිරීම් 6 කට අදාලව ඔප්පු ලබාගත් බවට තහවුරු නොවුණි.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

(අ). සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 87 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට තත්‍ය සේවක සංඛ්‍යාව 74 ක් විය.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට ලේකම් තනතුර වැඩ ආවරණය කරමින් පැවති අතර කාර්මික නිලධාරි තනතුරු 04 න් 01 ක්ද, ආදායම් පරිපාලක තනතුරු 04 න් 02 ක්ද, පුස්තකාලයාධිපති තනතුරු 3 න් එකක්ද පුරප්පාඩුව පැවතුණි.

## 2.6 සභාවට එරෙහිව නෛතික කරුණු

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ

(අ). ඉඩම් කොටස් පවරා ගැනිම වෙනුවෙන් පවරා තිබූ අංක 4014 හා අංක 6391 දරණ නඩු දෙකක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පැවතුණි.

(ආ). සභාව විසින් ඉඩම්හිමියන්ගේ අවසරයක් නොමැතිව මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීම හේතුවෙන් ඉඩම් හිමියන් විසින් සභාවට විරුද්ධව පවරන ලද නඩු 4 ක් වූ අතර, නඩු සඳහා රු.13,100 ක් නීතිඥ හා ලිපි ලේඛණ සැකසීමේ ගාස්තු ලෙස ගෙවා තිබුණි. එමෙන්ම සභාව සතු මාළු වෙළඳ සැලෙහි අයිතිය සම්බන්ධව පැවති අංක 6749 නඩුවට අදාලව, නැවත අභියාචනා ගොනු කර තිබූ අතර, එකී අභියාචනය සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අවසන් වී නොතිබුණි.

(ඇ). සභාව විසින ඉහල කලල්පිටිය මාර්ගයේ සිට වෙළ හරහා වැටී ඇති මාර්ගයක් සංවර්ධනය කිරීම හේතුවෙන් වරකාපොල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගයෙන් අනතුරුව ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයාට මෙකී කරුණු සම්බන්ධව බලය ඇති බවත් ඒ අනුව ක්‍රියා කරන ලෙසත් දන්වා 2008 ඔක්තෝබර් 30 දින නඩුව නිෂ්ප්‍රභා කර තිබුණි. ඉන් අනතුරුව ඉඩමේ අයිතිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ පවරන ලද නඩුවට අදාලව 2011 ජුනි 10 දින කොමිෂන් සභාව විසින් නියරේ අතුරා ඇති පස් හා ගල් ඉවත් කරන ලෙස සභාවට නිර්දේශ කර තිබුණි. ඒ අනුව සභාව විසින් 2011 සැප්තැම්බර් 23 දින මාර්ගයේ පස් හා ගල් ඉවත්කිරීමේදී ඊට යාබද කුඹුරු ඉඩමකට හානි වූ බවට දක්වමින් එක ඉඩමෙහි අයිතිකරු විසින් 2011 ඔක්තෝබර් 26 දින අංක HRC/2949/11 යටතේ සභාවට විරුද්ධව මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩු පවරා තිබුණි.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ

(අ). පුර නැගුම යටතේ ප්‍රාග්ධන වැය ලෙස රු.මිලියන 50 ක් වෙන්කර පැවතියද, එකී කාර්යයන් ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) සභාවට අදාලව සංයුක්ත සැලැස්මක් නොතිබූ අතර, අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුවක් පැවතුණි.

(ඈ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු7,523,672 ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු…21,822 බැගින් එකී අරමුදල විසින් අයකර පැවතියද, එකී අයකිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

## 2.8 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශය තුල එකතු වන කසල බැහැර කිරීම ස්ථාන 3 කදී ඉටුකර තිබූ අතර එහිදී කසල වර්ග කිරීමක් සිදු නොකර කපන ලද වලවල් වලට බැහැර කිරීමක් සිදුකර තිබුණි. රු.5,210,000 ක් වැයකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබූ අතර, එයින් කොම්පෝස්ට් නිෂපාදනයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සිදුව නොතිබුණි. මෙම ස්ථානයට බැහැර කරන කසල වර්ග කර බැහැර කිරීමක් හෝ කොම්පෝස්ට් නිෂ්පාදනයක් සිදුව නොතිබීම හේතුවෙන් මධ්‍යස්ථානය අවට අපිරිසිදුව පැවතුණි

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) මානව සම්පත් කළමනාකරණය